# කව්මුතුහර



සිතේ ඇති දේ
තුඩින් කවි ලෙස
ගෙතූ කවි මුතුහරින්
ඔබ වෙත

**M.A. ආදිත්‍යා ඉදුෂාණි**

# පිදුම...

මාගේ ලොවේ සඳු බඳු වූ
දස මසක් කුස හොවා
මා මෙලොවට බිහි කළ
රහසේම දුක්ගිනි විඳින
මා මෑණියන්වන
L.G සුමුදු රන්මලී මාගේ මෑණියන් වහන්සේට

මගේ ලොවේ හිරු බඳු වූ
අපේ දිවිය එළි කරනු රිසියෙන්
දිවා රෑ වෙහෙසන
මා පිටුපස යෝධ පවුරක් ලෙසින් සිටින
මාගේ පියාණන් වන
M .A.ජයන්ත ප්‍රේමලාල් මාගේ පියාණන් වහන්සේට

දෙනෙතක් පමණක් නොව
සුවහස් දරුවන්ගේ ජීවිත
නැනෙලි කරන්නට
තම ගුරු දිවියම කැප කරමින්
තවමත් එම මහාර්ඝ වූ ක්‍රියාවෙහි යෙදෙන
මාගේ ගුරු මෑණියන් වන
W.P. ප්‍රියන්තා මේනකා
ගුරු මෑණියන්ට ද

මා බහ තෝරන කළ සිට
සෑම අංශයකින්ම ඉදිරියට යෑමට අතදුන්
සත්කෝරලයට පමණක් නොව
ලක් දෙරණේ සිව් කොණට කවි රස බෙදූ
83 විය සපිරෙන
මාගේ මිත්තනිය වන
ශිලා තෙන්නකෝන් කවිකාර මිත්තනියට

# පටුන


1. මේ දෙරණේ බර උසුලන මහී කතයි අම්මා
2. තේජස් ඇති ඒ මහ කළු සිංහලයෙකි පියා
3. දුර සිටින අයියා වෙත,
4. ඇයිදෝ නොයන්නේ දහමට
5. දෙන්න අම්මේ අවසර මට සොයා යන්න නිවනේ මඟක්
6. ඔබ කරනා මෙහෙයටයි මේ කවි මල් දම් ගෙතුවේ.
7. නැග්ගමු යන්නට කතරින් එතෙරට
8. ලක් මවූ....
9. සඳ තතු
10. පිල උඩ දුම්බට.........
11. වෙහෙස උනේ තුන්යම අපි - නිවන්න කුස ගිණි
12. විෂම ලෝකෙක තනිවෙලා
13. මගේ දූ
14. මුහුදු දිවියේ
15. පැලේ සිට......,

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ **"දිවිය දිනන විද්‍යුත් පොතක් "**ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

**ශෂිකලා සේනාධීර**
**විදුහල්පතිනිය**
**මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර**
**2023 . 11 . 01**

**මේ දෙරණේ බර උසුලන මහී කතයි අම්මා**

වැටුප් රහිත රැකියාවක නිරත විවී අම්මා
රෑ නිදිවර දරුවන් අනෙ රැකගන්නේ අම්මා
සඳක් ලෙසින් අප ලොව එළියකරන අම්මා
අහසේ අඳුර මෙන් අප සනදුරු මැකුවා අපෙ අම්මා

කුස පිරෙන්න අපහට බත් කැවුවේ අපේ අම්මා
දංකුඩයම සූරාගෙන කෑවා අපෙ අම්මා
තරුණ දිවිය දන්දුන්නේ දරු ස්නේහෙට අම්මා
දරු දෙරණේ බර උසුලන මහීකතයි අම්මා

වලට ගොසින් දර කඩමින් ගෙන ආවේ අම්මා
වේල්වලට එවෙලෙ සොයා ආහාර පිස අම්මා
හේනෙ තිබෙන අව්රශ්මිය ගණන් නොගෙන අම්මා
අප රැක්කේ සුරවිමනක තබමින් අපෙ අම්මා

අප නිසාම තරුණ දිවිය කැප කරමින් අම්මා
තම දිවියට සීමාවන් පනවගත්ත අම්මා
සරු කෙරුමට අපේ දිවිය වෙහෙස විවී අම්මා
සතර බ්‍රහ්ම විහරණවල නියම අරුත අම්මා

හේනට ගොසින් නිතරම වැඩ කරමින් අපෙ අම්මා
අප අකුරට යැයුමට වෙර දරමින් අපෙ අම්මා
දරුවන් නිතර තුටු කරනා අපේ ආදර අම්මා
මේ කවි මම පද බැන්දේ ඔබෙ වෙනුවෙන් මයෙ අම්මා

**තේජස් ඇති ඒ මහ කළු සිංහලයෙකි පියා**

පර්වත රාජයෙකි මගෙ අනෙ පියාණෝ
වීර වික්‍රම් පෑ පරපුරෙ පියාණෝ
රට රැකුමට ගිණි අවියට බියනැති මගෙ පියාණෝ
සුවහස් දරුවන්ගෙ දිවිය රැකගත්තේ පියාණෝ

රැකියාවට උදේ හවා ගොසින් අපේ පියා
මඩකුඹුරුද අස්වද්දා සරුකෙරුවේ පියා
ගොඩමඩ ඒ ශාකවලට ජීවය දුන් පියා
මේ සැමදේ හොඳින් රැක්කෙ අප රකින්නට පියා

අපේ සතුට ඔහුගෙ සතුට ලෙස සිතුවේ පියා
ගලනා වූ ඒ දහඩිය පනම් කළේ පියා
අපට සුවය සදනු පිණිස දිවියම කැප කළේ පියා
තේජස් ඇති ඒ මහ කළු සිංහලයෙකි පියා

අඹු දරුසෙනෙහස කැටිකර පෙම් බැන්දේ පියා
නිතරම විමසුම් සිහියෙන් අපගැන සෙවූ පියා
ලොවක් රකින ජීවවායු ලෙසින් හිදිව පියා
අපරැක්කේ අප නොදන්න ප්‍රේමයෙනුයි පියා

අත්දැකීම් පුරවාගෙන ලොවම දැනත් පියා
සුළු වරදක් වත් නොකරම යන්න කිවුවෙ පියා
කුඩා කලම සිටන් අපට යහගුණ දුන් පියා
ඔවදන් දී අප යන මග බලා සිටියෙ පියා

කඳුළු සිවා සඟවාගෙන මගේ පියා
සෙවනැල්ලක් ලෙසින් සිට අප පසු පසම පියා
රන්වන් කරල් බරවෙන සේ මගේ පියා
ගුණදම් කැටිව අප රැකගන්නෙන් පියා

දනට පිනට සිත්දී අප සිත් යොමු කළ පියා
පාරමිතා පිරීම අනෙ පසෙක තබා පියා
මෑණි සමඟ අපව කැටුව යහමග යන පියා
නෙතේ බුදුන් දැක නිවනම සාදාගන්න පියා

**දුර සිටින අයියා වෙත,**

මටත් කලින් අපේ ගෙදර කිරුළු පලන් අයියා
මා ආපසු යුවරජ ලෙස මා තැබුවා අයියා
මේ රාජ්‍යයේ යුධ ඇරයුම් කළේ අපේ අයියා
නිවහන තුළ විසල් විනාසයක් කළේ අයියා

මටම කියාට ඉන්නේ මගේ ආදර අයියා
අයියල නැති දරුවන් ශෝක වෙනවා සැමදා
අයියල සිටිමුත් තවකෙකු ශෝක වෙනවා දිටිමා
දුර සිටියත් ලඟනැති ඒ අඩුව දැනේ මෙමටා

දඹර වෙන්න ඕන කාලේ දබර වෙන්න ඔබ ළඟ නැ
විරස වෙන්න ඕන කාලෙ විරස වෙන්න ඔබ ළඟ නැ
රණ්ඩු වෙවී අහර කන්න ආස වුනත් ඔබ ලග නැ
තනිව ගන්න මේ අහරේ කිසිම රසක් මට නම් නැ

කෙමින් කෙමින් ගෙවී යන්නේ අපේ ළමා දිවිය අයියේ
දුරකථනෙන් කතා නොකර සිටියත් එම නිති අයියේ
ඔබේ රූප දැක ගන්නට එබී බැලුව අයියේ
කතා නොකෙරුවාට මෙමා තරහක් නෑ නේද අයියේ

මේ කවි පද බැඳෙනා විට මතක් උනා කුඩා කාලෙ
මට වගේම ඔබටත් ඇති සොදුරු මතක ඒ පෙර කාලේ
අලුත් මතක රැස්කරගනු රිසී අනේ මේ කාලේ
ඉදින් එන්න ඉක්මනින්ම මෙරටට අනේ මේ කාලේ

කරන කරන හැම වැඩක්ම හරියාවා
සිතන සිතන සැමදෙයක්ම ඉටුවේවා
දෙමව්පියන්ව ඔබ නිති රැකගත්වා
මගේ ආයුෂත්ගෙන ඔබ දිගුකල් වැජඹේවා

## ඇයිදෝ නොයන්නේ දහමට

සන්සාරික බිය ගමනක
ලබමින් අපි මිනිසත් බව
ඇයිදෝ තවත් පසු වන්නේ
පිං කෙරුමට අද අදම

මිනිස් බවේ වටිනාකම
නොදන්න මිනිසුන් ලෙස සිටගෙන
ගෙව්වත් අපි ජීවිත ගඟ
බෑ ගන්නට නැවත මුලට

දවස දවස ගෙවී යන්නේ
මිනිසත් බවයේ ආයුෂ
පිං කෙරුවේ නැතොත් මිතුර
යයි නිරයට කල් ගෙවුමට

සත්ව ලෝකෙ ඉන්න සතුන්
ගෙවන්නෙ මේ සැප ජීවිතද
බුදු දහමේ සිසිල නැතුව
කොහොමද ලබනුයේ සතුට

මිරිඟුවක් ම පස්සෙන් යන
පිපාසයෙන් ඇවිද දුවන
සතුන් වගේ අපි තැන තැන
ඇයිදෝ නොයන්නේ දහමට

**දෙන්න අම්මේ අවසර මට සොයා යන්න නිවනේ මඟක්**

මේ භවයේ මට ලැබුණා පිරිසිදු මිනිසත් බවක්
ආදරයෙන් වෙළී තියෙනා සංසාරික බිය ගමනක්
සැවොම යන්නේ එකපාරේ මම යන්නද වෙන ගමනක්
වරම් දෙන්න මගෙ අම්මේ එතෙර වෙන්න මේ බවෙවත්

වෙර වීරිය ඔබ කරළා මා ඇන්දුවා මගේ අම්මා
වෙනෙකෙකු හට නොදුන් ආදරේ දුන්නාමට මගේ අම්මා
සෙනෙහෙ සිතින් මා හදලා පිදුවොත් ඔබ බුදු සසුනටා
නිවන් යනවා මගේ අම්මා හතර වරිගයත් සමඟා

දුක්කිත මේ සංසාරේ එනවා අපි දුක් විඳ විඳ
එපා වෙනවා මගේ අම්මේ මේ සංසාරෙම ගමන
යනවා යනවා නොනැවතීම කවදා නතර වේද මේක
ඉඩක් දෙන්න මටත් යන්න මේ සසරේ නැවතීමට

තනි තනියෙම යන ගමනේ මම යන්නේ තනියෙන්නේ
මේ භවයේ ඔබ ඇවිල්ල දුන්නා මට රැකවරනේ
මින් මතුවට ඔබේ රැකවරනේ ලැබෙයිද මට මගේ අම්මේ
ගමන දුරයි නැවතුම කෙටී මට බයයිනෙ මගේ අම්මේ

දුරගමනේ අවසානය සොයා යන්න ඕනේ අම්මේ
බියකරුමේ සංසාරෙන් එතෙර වෙන්න ඕනේ අම්මේ
මින් මතුවට පිළිසරණක් සදාගන්නේ කෝම අම්මේ
බුදු සරණේ සරණ හැරා වෙන සරණක් කොයින්ද අම්මේ

පිළිසරණින් එහා ගිහින් නිවනේ මඟක් සොයාගන්න
කසාවතේ තියෙන සුවේ මේ භවයේ විඳගන්න
රාග ගින්න වෙළී තියෙනා සිත් උගුලා විසි කරන්න
අවසර දෙන්න මටත් අනේ කසාවතේ සුව විඳින්න

නීරස මේ ලෝකේ දිහා බලන් ඉන්නේ ඇයිද තවත්
කඩා වැටේ ඉදිරියටම මේ තියෙනා සැප සම්පත්
පලකුත් නෑ රසකුත් නෑ මේ සසරේ කිසිම තැනක්
දරාගමුකෝ පිරිසිදු වී පාරිශුද්ද චීවරයක්

මේ සසරේ අවසානේ නිවනට මට යන්න දැන්
මගේ අම්මා අවසර දෙයි දැහැනට සම බැඳී සිතින්
අම්මෙ ඔබත් දන්නවානේ මේ නීරස ලෝකෙ ගැනත්
දෙන්න අම්මේ අවසර මට ඔයා යන්න නිවනේ මඟක්

## ඔබ කරනා මෙහෙයටයි මේ කවි මල් දම් ගෙතුවේ.

ශිල්ප සතර ඉගෙනුමටයි ආවෙ    එදා
අම්මාගෙන් වෙන්ව  අඬමින් කඳුලු    සලා
තනිකම දෝරෙ ගලනා ඒ වෙළේ    පවා
ගුරු අම්මා කෙනෙක් ගත්තයි තුරුළටම    එදා

ටික ටික හුරුඋනා පාසල වෙතට    මෙමා
කාලය ගෙවීමත්   සමඟම ආවා    මෙමා
පන්තියෙන් පන්තියට ආවා කාලෙත් එක්ක    මෙමා
නදහයේ වසරෙ ඉන්නා දරුවෙක්ය    මෙමා

කොළට හුරු රියක් පදවමින් ආවා    ලියා
බැස්සයි දකුණු පා තබමින් කෙලින්    බලා
ඔසරිය  හොඳට පිළිවෙළකට    සඳමින්නනා
ඇයි යයි  අත්සන් තබනට කාර්යාලයට    බලා

දහය වසරෙ ඉන්නා දරුවෙක්ය    මෙමා
කොළ රිය පැදවමින් ආ ගුරුතුමිය එයි    මෙදෙසටා
ටිකක් සැරට පෙනුනත් අනෙ අපට    එදා
වැහුණ මුහුණ අතුලින් පෙනුනයි    සිනහා

බොකටු කොණ්ඩෙ ගෙඩියක්    ගසමින්නේ
අඩි උස  දමා ඔසරියමයි ඇඳ    එන්නේ
ඈතින් එන විට ප්‍රභාවතියක්    පෙනුනේ
තරුණ ලියන් පරදයි ඔබේ එක    බැල්මේ

පාඩම් හොඳින් රස කරමින්    ඉගැන්නුවා
වචනෙන් වචනෙ හෙමිහින්  අපෙ හිතට    ගියා
සැකකරමින් බැන්නත් ඔබ තුමිය    එදා
හැමවිට ඉගැන්නුවේ යහගුණමයි    අපටා

වැටෙන  හැමවිටම ඔබ ළඟටම    ආවා
වැටි වැටි නැගිටිනා හැටි හැමවිට    කීවා
හැම දරුවෙකු ගැනම  හොඳ විමසුමෙන්    උන්නා
දරුවන් රකින අම්මෙක් ලෙස අප    රැක්කා

නමය වසරෙ සිටමයි ඔබෙ ඇසුරට    බැස්සේ
හැමවිට දිරිය දී ඔබ තුටු විය සිත්    සේ
යන්නට සිතේවි ඔබ ගිය මඟ    ඔස්සේ
ඔබ කරනා මෙහෙයටයි මේ කවි මල්දම්    ගෙතුවේ

තෙරුවන් බෙලෙන් ඔබෙ ආයුෂ    වැඩිවේවා
කරන කරන හැම වැඩක්ම හරි    යාවා
තබන තබන පියවර ගානේ මල්    පිපේවා
ඉක්මනින්ම නිවනට මඟ    පෑදේවා

## නැග්ගමු යන්නට කතරින් එතෙරට

මත් බර නෙත් යුග
හදයට චංචල
ගති අඳ බුරමින්
පැන නැගුනේ

බුදුහිමි නැතිකළ
දහමදපිරිහී
අවසන් නැව
ගමනට ඇරඹේ

කම් සැප විඳිමින්
ධන පොදි බැඳගෙන
යන්නට දෝ
සසරින් එතෙර

බඩුමළු පසෙකළා
පින්මළු අරගෙන
නැගගමු යන්නට
කතරින් එතෙරට

දිගු වූ ගමනකි
විඩාබරින් සිත
යහමින් තෙත් වන්නේ

සසරේ අප අනෙ
රැගෙන පැමිණි ඒ
කර්මයමයි අද
පලදෙන්නේ

මිනිස් වෙසින් අද
දෙවිවරු ඇවිදින්
නැගගනු යැයි
පවසයි නැවට

කම්සැප පොදිලා
අඟුළු දමා ඇත
ප්‍රඥා යතුරැත්
දිරාගොසින්

කෙතරම් කීවද
කිසිම එලක් නැත
මිනිසා හොඳටම
පිරිහී ගොසින්

ආයුෂ අඩුවී

ගුණදම් පිරිහී
පිලයට නඩු
අසනා කාලයකි

නැව අනේ ටික ටික
යාත්‍රා අරඹයි
සමහරෙකු තවමත්
පැමිණෙයි

| | |
|---|---|
| සයුර | ගැඹුරට |
| යා නොහැකි | ලෙස |
| පිරී නොමැත | තව |
| මිනිසුන් | යහමගට |

| | |
|---|---|
| තැන තැන | දුෂ්කර |
| බවුන් වඩා | සිටි |
| පින් ඇති | උතුමෝ |
| නැඟුමට | එයි |

| | |
|---|---|
| එවන් කෙනෙකු | මිස |
| අන් කිසිවෙකු | අද |
| මේ දෙස | බලමින් |
| නො පිය | නඟයි |

| | |
|---|---|
| ටික ටින | ඉඟිදුන් |
| කළ දුව | ඇවිදින් |
| නැග්ගයි | මිනිස්සු |
| එදා | කළ |

| | |
|---|---|
| නැවු ගොස් | අවසන් |
| අන්තිම නැවු | අද |
| යන්නට | සැරසෙයි |
| සසරින් | එතෙරට |

| | |
|---|---|
| අවසන් | කල්පයේ |
| අවසන් නැවු | නඟී |
| මිනිසුන් | අද |
| කතරින් | යන්නේ |

| | |
|---|---|
| බල | තන්හාවේ |
| මුල්බැස ගත් | උන් |
| තාමත් | සසරේ |
| බැට | ගන්නේ |

## ලක් මවූ....

ලක් මවගේ දරුවන් වන අප සැවොම
අම්මා තුරුලෙමයි ඉන්නේ සැම විටම
නමුත් ඇයිද නොපෙනෙන්නේ අම්මාව
අසනීපයි පුතේ අපේ ලක් අම්මට

අපට දුන්න හැම වටිනා දේකටම
අප ණය නැතිද අපෙ දෙවැනි අම්මාට
දරුවන් ගොඩක් රකිනා අපෙ අම්මාට
ඇයි දෙන දුක්ගිණි බලමින් ඉන්නෙ තව

ලක් මවගේ පුත්තුන් හට දුන්නා අනේ
අම්මා රකින්නට කියා අපි සැවොම බලේ
බලේ අරන් කෙරුවත් නොහොබිනා වැඩේ
තාමත් අම්මා තරහක් නෑ පුත්තුන් එක්ක අනේ

මගේ අම්මා මගෙ නිජ බිමනෙ අනේ
එම නිජ බිමට කරනා ඒ කුරිරු වැඩේ
එක පුතෙකු සිටියත් අනෙ දුස්සීලේ
තම ගැන පමණක් සිතයි ඔහු සැම විටම අනේ

මිනිස්සු නිදහසේ ඉන්නා එකම තැන
තම දේශය නොවද අනෙ අපේ මහ ගෙදර
නමුත් අනේ ඇතුළේ තියෙනා භේද
දුරලමු අපි සැවොම එක් වී සඳහටම

ආත්මාර්ථයේ සිටිනා පුතුන් අනේ
ගස් කපමින් කුඩු ගේමින් කෙරුවා වැඩේ
කොල්ලො ටිකගෙ ශක්තිය දැන් නැතුවානේ
පර දේසයට කන් අදිනා සිවලුන්නේ

අපේ රටට වී ඇති මේ හෙනේ දැකත්
ඇයිදො අනේ මර නින්දේ පසු වන්නෙ තවත්
බියෙන් අනේ අපි සැවොමා සිටියොතින් තවත්
ශාප කරයි ඉදිරි පරපුර අපටත්

බොල් මත දරණා මිනිසුන් අනේ
පන්නමු රටින් කළ මේ ව්‍යවසනෙට අනේ
විද්වතුන්ගෙ මණ්ඩලයක් සාදමින් අනේ
ඉදිරිය ගැන සිතා සාදමු වැඩපිළිවෙලක් අනේ

රාජ ධර්ම ධන්නා පුතෙකුත් ගෙන
අභිෂේක කරමු මතු පළදා රන් සළු මෙන්ම
කරවිද්ධ මගෙ දේශය පණ පොවමින් අද
ඉමු අපි සැවොම සවියක් වී ඔවුන් හට

කෑලි කඩා විකුණූ අපෙ දේශයේ
කොටස් නැවත එකිනෙක ගෙනවිත් අනේ
සරු කරමින් සුර පුරයක් කරමු අනේ
ගොවි මහතුන් නිතැතින් නිවයි බඩගින්න අපේ

**සඳ තතු**

අද උදා වෙන සඳට
හමුවෙලා අපට
ඉන්න හැකිනම්
නුඹ ලඟට කැටුව මම
සිත කියන රහස
සෙමින් කියන්නන්

අඳුරු අහසෙ
තනිය මකන
ඒ සඳ වෙනවනම්
මගේ අහසම
එළිකරන්න

අවසර ගන්නම්
ආදර හඳ මොදුවෙවී
පුරසඳ වෙනවා
මම නුඹට නොකියනා
තතු ඒ සඳම කියනවා

මගෙ පෙම් හසුන
හොරැහින් සඳ කියනවා
මා ළඟ සිටිනා
ඔබ තව එය නොදන්නවා

පුරසඳ ටික ටික අහසට
අඳුර ගෙනෙනවා
අතින්ත් ගෙන ගිය ඔබ තව
එය නොදන්නවා..........

## පිල උඩ දුම්බට.........

පියදරු සෙනෙහස
එක්තැන් වුණු අපෙ
පිලයට මහගෙදර

පිය මහ රජු විත්
රෑ නිදි වරනා
සුව දෙනෙ පිලි පැඳුර

අම්මා වටකර
අප සැම එක්වී
කතා කියන ඒ
සොඳුරු තැන

දරුවන් සිවුදෙනා
සමඟින් තනිවී
අම්මා පිල අසල

නන්නාදුනන
පිරිසක් විත්
පිල ළඟට

විසිකර දමා
මල්ලී දුටු
විගස දුව

පතුරම් සහිත
දුම්බටයක්
පිල අසල

දමනවා
දුටුවේ
මා ප්‍රිය මලනුවන් පමණ

මායිම් වලට
දඹරව සිටි
ගුණදාස

පිල උඩ දුම් බටය
යැයි පවසා
පියා
දැමුවේ සිර ගෙට

## වෙහෙස උනේ තුන්යම අපි - නිවන්න කුස ගිණි

රෑ නිදිවර වෙහෙස විවී
සොයා බලා නිති
වගාවටම කැපකළ අනේ
අපෙ ජීවිත නිති
දරුවන්ගේ අනාගතේ
සරුකරනා රිසි
සොයා බලා සරුම කෙරුවෙ
මේ වගාව නිති

අලි උවදුරු
වගා ප්‍රශ්න
නිති ඇවිදින් අනේ
නසා අපේ සියලු පැතුම්
සීසීකඩ විසි
අප සතු සම්පත් සියල්ල
නිති කැපකර සිටී
මේ වගාව දැන් ගොස් අනේ
පාලුවටම නිති

අහස උසට
පැල් බැඳි අනේ
අපේ සිහින පොදි
කෙමින් කෙමින්
දියවී ගියේ
වැටෙනා ලෙස ඉටි

සිහින මාලිගා නොව අනෙ
ගැට ගැසුමට දිවි
වෙහෙස උනේ තුන්යම අපි
නිවන්න කුස ගිනි

අස්වනු මළු නොවේ අපට
ප්‍රශ්න මළුයි ගෙට
බලාපොරොත්තු පසෙකලා
ගෙවුමට ණයබර

ගැලුවා වූ ඒ  දහඩිය
මතක් නොකර අප
දෙපාමුල වැටී ණයහිමි
කියයි අපේ දුක

ගත්තා වු ඒ ණයබර
කෙමින් කෙමින්අප
අයැදසිටී දෙන ලෙස තව
ණය ගෙවුමට දින

කන්නයක්ම පාළුවෙලා
ජීවිත අපෙ සින්වෙලා
කලින් කන්නේ වීම්ටියත්
අලි බීලා යන්න ගියා

# විෂම ලෝකෙක තනිවෙලා

විෂම පිරිසක් එකම රාමුව
තුළම අද අනෙ  කොටුවෙලා
ඔවුන්ගේ අනෙ විෂම සිතිවිලි
රාමුවම තුළ වැලලිලා

සැබෑලෝකෙ
යථාවබෝධයට
වැසී ගොස් අද
කාමලෝකෙට

මුලා වූ මේ සසර කතරේ
සැබෑ අයුරු දුටුව තවවුත්
රාමුවෙන් පිට පුළුල් පෙදෙසක
ගොසින් අත්කර ගන්තෙ නිවන

කටුවූ මේ
පටුවූ මාවතේ
දිනුම යැයි ඒක දදක් ලෙලදේ
සැවොම යන්නේ එමෙ එ මාවතේ
දිනුම ගන්නට සැවොම පරයම

පොතපතේ ඇති දැනුම අතරෙම
ජීවිතය අපෙ ලියැවිලා
රාමුවක වටවිලා අපසැම
විෂම ලෝකෙක තනිවෙලා

අනාගතයේ අපේ වෘත්තිය
සරදමක් මෙන් පොතේ හැමතැන
පොදි ගසා පිටු මතකයේ අද
ලියන්නට ඇත දිනක කොලයක
ධාරිතාවේ මතක අතරෙම
පුරවමින් අපි පොතේ කරුණුම
පොතෙත් පිට ඇති ලෝකයක් ගැන
සෙවීමටවත් කාලෙ නැත අද

නිදහස යනුවෙන් පටබැඳි
නාමයකින් කිරුළු දරන්
මේ ක්‍රියාවෙ අවසානය
වැඩ ලෝකෙම උරුමකරන්

අප දිවියේ අවසානය
දක්වා අනේ වැඩලෝකේ
නිදහස නැතිවී කොටුවී
අප නැවතත් ඒ මද්දෙම

සත්‍යය අනේ  මේ නොවේය
මේ එක් අනෙ නැවතුමක්ය
පිං බලයෙන් අපි මේ බව
ලබා උපන්නේ මනු ලොව

මිනිස් දිවිය සැබෑ අරුත
නොදන්න මිනිසුන් ලෙස අප
ඇයිදො තවත් නොසිතන්නේ
මේ බවයේ වටිනාකම

මුලාවූ මේ  රාමුවම තුළ
කොටුවී ඇත්තේ ඇයිදො අපහට
උතුම් වූ ඒ නිවන් මඟ වෙත

**මගේ දූ**

මගේ දූ අනේ බාල සමයේ
මගේ තුරුලෙම හැදී හිනැහුණු
මලක් සේ මම හදා හිනහුණා
තැලී නොතැලී පරවුණු

එන්න එන්නම දූ ලොකුයි අනෙ
ගෙදර කිළි කැවුනත් ඉදේ
තාත්තිට හරි සතුටු හිතෙනවා
හැබැයි ලොකු බයකුත් හිතේ

කුමරි බඹසර වෙවී ටික ටික
කාලෙ යනවිටගෙවීලා
කුමරි යන්නට කුලකුමරි සේ
කාලෙ දැන් හරි ලංවෙලා

තාත්තිට දූ යන ගමන ගැන
දුකක් තිබුණාත් හදවතේ
නමුත් අනේ ඒ දුවගේ සතුටනෙ
තාත්තී ගොලු වී හදේ

මගේ තුරුළේ සදා හිනහුණු
මගේ කුමරිය පාවෙලා
යන්න අද අනෙ කලබලෙන් වගෙ
තාත්ති ළඟ නොරැඳීලා

පෝරුවට නැඟ
යන්න ඉඟිලිව
අවසරය අදඉල්ලලා

දෙමින් අවසර රැගෙන ඔබ අද
ගියත් අද අනේ පාවෙලා
එන්න නැවතත්
මගේ දුව වී මගේ හදවත
සිබ සිබ
(සිසාරා)

## මුහුදු දිවියේ

ගස් නැති වන මඟ
ගොස් අද තනියම
දඩයමටයි මා මේ
යන්නේ ගෙදර
පැටවුන්ගේ
කුසගිනි ඇසුනම
සිත නෑ මගෙ වාවන්නේ
ආදර නෙත්බර බිරිය මගේ අද
ගෙවනා දුක් ගිනි ඇසවැටෙනාවිට
උන්ගේ බඩගිනි නිවාදමන්නට
මැදියම් රෑ මා එලිබස්සේ

සුළඟ වැඩිවෙමින්
රළ පහරේ හඬ
හඳතුළ බීතිය උපැද්දුවේ
නමුත් අපේ මේ දිවි ගැට ගැසුමේ
මුහුඳයි අද අනෙ පිරිසරනේ

**පැලේ සිට......,**

රෑ අඹර ඝන
වළාකුළු විත්
ලැගුම් ගන්නේ හදවතේ

හිරුදද අවරින්
පිටත් වුණු පසු
නිසොල්මන් හඬ සාගරේ

ළමා ලපටි කුරුළු ගීතද
සවන් ළඟ නොරැදෙනු ඇතේ
ඔබද තනිකර පැල ආමා
සොයයි ඔබගේ මිහිරි නාදේ

ඝනින් ඝනදුරු
දුරු කරන ඔබේ
ප්‍රභා රශ්මි ස්වභාරූපේ
නිමද මාගේ දෙනෙත් පිනවූ
නීල නිල්වන් දෙනෙත් යුගලේ

මොලොක් අතිනත් පටලවා අප
මෙසේ ගෙවුවත් ජීවිතේ
ඔබද මා මේ අවුත් ඉන්නේ
තනිව යන මහ සාගරේ.....

# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක
2023 . 11 . 01